# බස්නාහිර පළාතේ 1991 අංක 05 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය.

# THE FINANCIAL (AMENDMENS) STATUE OF THE WESTERN PROVINCE NO; 05 OF 1991

1991 අංක 06 දරණ බස්නාහිර පළාතේ, මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරිම සදහා වු ප්‍රඥප්තියකි.

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පවත්වනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ, 1991 අංක 05 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හදුවනු ලැබේ. — ලුහුඩු නාමය.

2. (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් හදුන්වනු ලබන) 1990 අංක : 06 දරණ බස්නාහිර පළාතේ, මුදල් ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ (5) වන වගන්තියේ (ඊ) ජේදය වෙනුවට පහත දැක්වෙන ජේදය ආදේශ කිරීමෙන් , ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — මුදල් ප්‍රඥප්තියේ 39 වන වගන්තිය.

(ඊ) ‘‘ජාතික රාජ්‍ය සභාවේ, 1978 අංක 27 දරණ නීති ආධාර පනත යටතේ සපයනු ලබන නීති අදරා උපයෝගි කර ගෙන, නඩුවක් පවරා ඇති, නඩුවකදී විත්ති වාචක ඉදිරිපත් කරන හෝ නඩුවකදි මැදිහත් වන තැනැත්තකු ලෙස, ඒ පනත යටතේ අනුමත කර ඇති නීතී ආධාර ක්‍රමයේ පරිපාලන නිළධාරියා විසින් සහතික කරනු ලැබඇති හෝ ඔහු විසින් විදිමත් ලෙස අනුමත කර ඇති යම් නිළධාරියකු විසින් සහතික කරනු

ලබන සියලුම ලේඛණ"

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ, " එහෙත් එවැනි සෑම අවස්ථාවදී ම , ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස් වරයා විසින් ඒ හේතු ඒ සාධන පත්‍රයේ සහතික කල යුතුය " යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 43 අ වන වගන්තිය ලෙස බලපවත්වන්නේය.:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 ආ වශයෙන් අලුත් වගන්තියක් ඇතුලත් කිරීම.

" 43 අ. බස්නාහිර පළාත තුල හෝ ශ්‍රී ලංකාවේ එක් පළාතක් හෝ ඊට වැඩි පළාත් සංඛ්‍යාවක් තුල හෝ පිහිටි, යම් නිශ්චල දේපළ පැවරීම සම්බන්ධයෙන් සාධන පත්‍රයක් අදාළ වන අවස්ථාවක , ඒ සාධන පත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ ප්‍රඥප්තියේ විධි විධාන සලස්වා තිබෙන ආකාරයෙන් ඒ සාධන පත්‍රයේ ගසා තිබේනම් හෝ ඒ සාධන පත්‍රය අදාල වන නිශ්චල දේපළ හෝ නිශ්චල දේපළ අතරින් යම් එක් දේපලක් හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් පළාත් සභාවක බල ප්‍රදේශ ඇතුලත පිහිටා ඇති විටක, ඒ පළාත් සභාවේ මුදල් ප්‍රඥප්තියේ විධි විධාන සලස්වා තිබෙන ආකාරයෙන්, ඒ සාධන පත්‍රය වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුව සමාන මුද්දර ඒ සාධන පත්‍රයේ ගසා තිබේනම් බස්නාහිර පළාතේ පිහිටි ඒ ඉඩම් සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රයේ නිසිපරිදි මුද්දර ගසා ඇති ලෙස සලකනු ලැබිය යුතුය."

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ " රුපියල් එකක මුද්දරයක් දැරිය යුතුය" යන වචන වෙනුවට "රුපියල් එකක මුද්දරයක් දැරිය යුතුය. නැතහොත් රුපියල් එකක මුද්දර ගාස්තුවක් 40 (2) වන වගන්තියේ සඳහන් කර ඇති ආකාරයේ

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම

නියමිත බැංකුවකට ගෙවිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ " අධිකරණයට" යන වචනය වෙනුවට "අධිකරණය නඩු.කටයුතුවලදි''යන වචන ආදේශ කිරිමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 (1) වන උපවගන්තිය සංශෝධනය කිරිම

7. 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ පිටසන් කල යුතුය." යන වචන වෙනුවට "පිටසන් කළ යුතු අතර ඉන්පසුව , ඒ ලේඛණයේ නිසිපරිදි මුද්දර ගසා ඇති ලෙස සලකනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරිමෙන් , ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 (2) වන උපවගන්තිය සංශෝධනය කිරිම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට වෙනත් වගන්තියක් ආදේශ කිරිම.

51. මීට පටහැනි යම් ගිවිසුමක් තිබේන අවස්ථාවක හැර මුද්දර ගාස්තුව-

(අ) පැවරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන ප්‍රදානලාභියා විසින්ද,

(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් .. ඒ සාධන පත්‍රය සකස් කරන, සාධන හෝ ලියා අත්සන් කරන තැනත්තා විසින්ද ගෙවිය යුතුය."

මුද්දර ගාස්තු ගෙවිය යුත්තේ කවුරුන් විසින්ද යන වග

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය (4) වන උපවගන්තියේ " යම් මියගිය තැනත්තකු ජිවත්ව සිටියේ නම්" යන වචන වල සිට "ඒ පොල්මඃකරුගෙන් අය කල යුතුය." යන වචන දක්වා වු සියලු වචන වෙනුවට "යම් මියගිය තැනත්තකු ජිවත්ව සිටියෙනම් , මේ ප්‍රඥප්තිය යටතේ කිරිමට ඔහු යටත්වන සියලුම ක්‍රියා කරුනු සහ දෙවල් කිරිමට ද ඒ මිය ගිය තැනත්තා ජිවත්ව සිටියේ නම් ඔහු පාර්ශකරුවකු වන සියලුම සාධන පත්‍ර සම්බන්ධයෙන් ඔහුගෙන් අයකල යුතු මුද්දර ගාස්තු ගෙවිමට ද ඒ මියගිය තැනත්තාගේ බුදලයේ පොල්මාකරු බැදි සිටින්නේය. " යන වචන ආදේශ කිරිමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරිම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය මෙයින් ඇතුලත් කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම

"(4) මේ වගන්තියේ කාර්ය සඳහා, මුද්දර යන්නෙහි, ඇලෙන මුද්දර ,ලාංජිත මුද්දර, හෝ 40 (2) වන වගන්තියේ සඳහන් මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳ සහතිකයක් ඇතුලත් වේ."

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් , ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම

"(3) මේ වගන්තියේ කාර්ය සඳහා, මුද්දර යන්නෙහි, ඇලෙන මුද්දර ,ලාංජිත මුද්දර, හෝ 40 (2) වන වගන්තියේ සඳහන් මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳ සහතිකයක් ඇතුලත් වේ."

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය III වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් , ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම

"මේ වගන්තියේ කාර්ය සඳහා, මුද්දර යන්නෙහි, ඇලෙන මුද්දර ,ලාංජිත මුද්දර, හෝ 40 (2) වන වගන්තියේ සඳහන් මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳ සහතිකයක් ඇතුලත් වේ."

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය (7) වන උපවගන්තියට (5) වන උපවගන්තිය යන වචන වෙනුවට" (6) වන උපවගන්තිය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය (4) වන උපවගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම

"(4) යම් සාධන පත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 (2) වන හෝ 40 (3) වන වගන්තියේ දක්වා ඇති ආකාරයට ගෙවා ඇති අවස්ථාවක , බැංකුව විසින් 40 (2) වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ගෙවීම පිළිබඳ සහතිකය විධිමත් පරිදි ඒ සාධන පත්‍රයේ අනුපිටපතට අලවා ඇති බව හෝ 40 (3) වන වගන්තියේ දක්වා ඇති ආකාරයෙන් කොමසාරිස්වරයා විසින් ඒ සාධන පත්‍රය පිටසන් කරනු ලැබ ඇති බව ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස්වරයා විසින් ඒ සහතිකයේ සහතික කල යුතුය."

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය (4) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් , ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.:

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය තව දුරටත් සංශෝධනය කිරීම

"(5) මේ ප්‍රඥප්තියේ යටතේ මුද්දර ගාස්තු අයකල යුතු සහ 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ විධි විධාන යටතේ හෝ මේ ප්‍රඥපතියේ විධි විධාන යටතේ හෝ 1991 ජනවාරි මස 31 වන දින දක්වා වූ කාලසීමාව තුළ විධිමත් ලෙස මුද්දර ගසන ලද යම් සාධන පත්‍රයක් හෝ ලේඛණයක් නිසි පරිදි මුද්දර ගසන ලද සාධන පත්‍රයක් හෝ ලේඛණයක් ලෙස සලකනු ලැබිය යුතුය."

16. ප්‍රධාන ප්‍රඥප්තියේ xxxi වන පරිච්ඡේදයේ ශීර්ශයේ "දඩ" යන වචනයට ඉක්බිතිව " සහ ගාස්තු " යන වචන එකතු කිරීමෙන් ඒ පරිච්ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ xxxi.වන පරිච්ඡේදය සංශෝධනය කිරීම

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම

99 (1) පළාත් තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයන් විසින් වරදවල් සම්බන්ධයෙන් පනවනු ලබන සහ අධිකරණයට ගෙවනු ලද සහ යම් ලිඛිත නීතියක් යටතේ වු යම් බද්දක් , ගාස්තුවක් හෝ වෙනත් අයකිරිමක්/අයකර ගැනිම සඳහා පනවන ලද දඩයක් නොවන සියළු'ම දඩ යම් ලිඛිත නීතියක් ප්‍රකාර ඒ දඩවලින් කලයුතු යම් ගෙවිමක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් දෙනු ලබන යම් විධානයකට යටත්ව, ඒ පළාතේ පළාත් අරමුදලට බැර කරන ලැබිය යුතුය.

අධිකරණ දඩ සහ ගාස්තු

(2) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක් විසින් එකතු කරනු ලබන සියලු අධිකරණ ගාස්තු ඒ පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය."

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 102 අ වගන්තිය වශයෙන් බල සහිත විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 02 වන වගන්තිය සංශෝධනය කිරීම.

102 (අ) (1) මේ වගන්තියේ මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන ආදයම් දිරිගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) 1991 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් වර්ෂ වෙනුවෙන් අරමුදලේ කාර්ය සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් වාර්ෂිකව ගෙවනු ලැබිය යුතුය.

(3) (අ) කොමසාරිස්වරයා විසින් සකස් කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව බස්නාහිර පළාතේ ආදයම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය මුදල්, සහ

(ආ) පළාත් ආදයම් කොමසාරිස් විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමෙහිලා

කාර්යක්ෂමතාවය සහතික කරුනු පිණිස කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුකූලව බස්නාහිර පළාතේ ආදයම් දෙපාර්තමේන්තුවේ අයත් නිලධරයින්ට සමූහ දිරිගැන්වීමේ දීමනා අරමුදලෙන් ගෙවනු ලැබිය යුතුය.

(4) පළාත් ආදයම් කොමසාරිස් විසින් යෝජනා ක්‍රමය නියමිත කාර්ය පටිපාටියට අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතුය.

මෙම වගන්තිය 1991 ජනවාරි 01 ද සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 06 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ "තක්සේරුකරු" යන අර්ථකථනයේ "ඒ පනතේ" යන වචන ඉවත් කර, ඒ වෙනුවට "මේ ප්‍රඥප්තියේ" යන වචන ආදේශ කිරීමෙන්,

(ii) ඒ වගන්තියේ "බලයලත් නියෝජිතයා" යන අර්ථකථනයේ (2) වන ඡේදයේ "කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද" යන වචනවලට ඉක්බිතිවම "හෝ තත්කාර්යය සඳහා 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනත යටතේ සාදන ලද නියෝග යටතේ, ඒ පනතේ කාර්යය සඳහා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද" යන වචන එකතු කිරීමෙන්;

(iii) ඒ වගන්තියේ "නිසිපරිදි මුද්දර ගසන ලද" යන අර්ථකථනයේ, "ඒ සාධන පත්‍රයේ ඇති බවද" යන වචනවලට ඉක්බිතිවම "නැතහොත් ගෙවීම් පිළිබඳ සහතිකයක් ඊට අලවා ඇති බවද" යන වචන එකතු කිරීමෙන්,

(iv) ඒ වගන්තයේ "සාධන පත්‍රය" යන අර්ථකථනයේ "යම් අයිතියක් හෝ බැඳීමක් ඇති කළ, පැවරූ, සීමා කළ, අහෝසි කළ හෝ සටහන් කළ හෝ එලෙස කළ ලෙස හැඟෙන සෑම ලේඛණයක්ම" යන වචන වෙනුවට බස්නාහිර පළාත තුළ යම් නිශ්චිත දේපළක් පැවරීමට සම්බන්ධ හෝ සෑම ලේඛණයක්ම" යන යවන ආදේශ කිරීමෙන්,

(v) ඒ වගන්තියේ "ඇටෝර්නි බලය" යන අර්ථකථනයේ "වෙනුවෙන්" යන වචනය වෙනුවට "වෙනුවෙන් හෝ" යන වචන ආදේශ කිරීමෙන්,

(vi) ඒ වගන්තියේ "පළාත් සභාව" යන අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන්,

> "පැවරීම" යන්නෙන්, විකිණීමක් අදහස්වන අතර, ඊට, මිය ගිය තැනැත්තකුගේ බූදලයේ පොල්මඃකරු විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් යම් දේපළක් සම්බන්ධයෙන් අර්ථලාභී අයිතිවාසිකමක් තිබෙන යම් තැනැත්තකුට හෝ මිය ගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය යටතේ පත්කරන ලද භාරකරුවකුට හෝ, භාරකරුවකු විසින් ආර්ථලාභියකුට හෝ ප්‍රතිෂ්ඨාවක් රහිතව ඒ දේපළ තෑගි දීම හෝ හුවමාරු කිරීම හෝ සමර්පණය කිරීම හෝ භාරකරුවකු විසින් හෝ මියගිය භාරකරුවකුගේ පොල්මඃකරු විසින් හෝ අද්මිනිස්ත්‍රාසිකරු විසින් ජීවත්ව සිටින භාරකරුවකුට හෝ අලුත් භාරකරුවකුට ප්‍රතිෂ්ඨාවක් රහිතව ඒ දේපළ සමර්පණය කිරීම ඇතුළත් වන නමුත් පොදුවේ දරණ ලද යම් ඉඩමක් බෙදා වෙන්කිරීමේ ඔප්පුවක් හෝ පැවරීමේ ගිවිසුමක් ඊට ඇතුළත් නොවේ."

(vii) ඒ වගන්තියේ, "වටිනාකම" යන අර්ථකථනය වෙනුවෙන් පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන්,

(අ) (තෑගි කරන ලද නිශ්චල දේපළක් නොවන) යම් දේපළක් සහ යම් දිනයක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් තක්සේරුකරුගේ මතය අනුව, ඒ දිනයේදී විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළ අදහස් වේ,

(ආ) 1977 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර ත්‍යාගදායකයා විසින් අත්කර ගන්නා ලද නිශ්චල දේපළක් වන, තෑගි කරන ලද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන්, -

(i) ඒ දේපළ 1977 මාර්තු මස 31වන දින විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබිණි නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලබාගත හැකි මිලට, 1977 මාර්තු මස 31වන දිනට පසු සහ ඒ දේපළ තෑගි කරණු ලැබුවේ යම් සාධන පත්‍රයක් මගින්ද, ඒ සාධන පත්‍රයේ සඳහන් වන දිනට පෙර ඒ දේපළට වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම්, හා එකතු කිරීම් කරනු ලැබුවේ නම්, ඒ වැඩිදියුණු කිරීම් වෙනස් කිරීම සහ එකතු කිරීම සඳහා ගිය වියදමට සමාන මුදලක් එකතු වූ විට ලැබෙන ප්‍රමාණය; හෝ

(ii) ඒ දේපළ තෑගි කරනු ලැබුවේ යම් සාධන පත්‍රයක් මගින් ඒ සාධන පත්‍රයේ

සඳහන්වන දිනයේදී ඒ දේපළ විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබිණි නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළ,

යන දෙකෙන් අඩු මුදල අදහස් වේ;

(ඇ) 1977 මාර්තු මස 31වන දිනට පසු ත්‍යාගදයකයා විසින් අත්කරගන්නා ලද නිශ්චල දේපළක් වන, තෑගි කරන ලද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන්-

(i) ත්‍යාගදයකයා විසින් ඒ දේපළ අත්කරගන්නා ලද දිනයේදී ඒ දේපළ විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබී නම්, තක්සේරුකරුගේ මතය අනුව, ඒ දේපල සඳහා ලබාගත හැකි මිළට, ත්‍යාගදයකයා විසින් ඒ දේපළ අත්කර ගන්නා ලද දිනයෙන් පසු සහ ඒ දේපළ තෑගි කරනු ලැබුයේ යම් සාධන පත්‍රයක් මගින්ද ඒ සාධන පත්‍රයේ සඳහන් වන දිනයට පෙර ඒ දේපළට වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් සහ එකතු කිරීම් කරනු ලැබුවේ නම්, ඒ වැඩිදියුණු කිරීම්, වෙනස් කිරීම් සහ එකතු කිරීම් සඳහා ගිය වියදමට සමාන මුදලක් එකතු වූ විට ලැබෙන ප්‍රමාණය; හෝ

(ii) ඒ දේපළ තෑගි කරනු ලැබුවේ යම් සාධන පත්‍රයක් මගින්ද, ඒ සාධන පත්‍රයේ සඳහන් වන දිනයේදී ඒ දේපළ විවෘත වෙළෙඳ පොළේදී විකුණනු ලැබිණි නම්, තක්සේරුගේ මතය අනුව, ඒ දේපළ සඳහා ලබාගත හැකි මිළ

යන දෙකෙන් අඩු මුදල අදහස් වේ.